සැ.යු .- 2015.07.24 දින පළ වූ අංක 1925 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,926 - 2015 ජූලි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2015.07.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 496 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 498 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 499 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 499 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 501 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

සැ.යු - ත්‍රිකුණාමලය, පන්කුලම, මොරවැව දකුණු සිරිගජබා ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2015 ජුනි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අගෝස්තු මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අගෝස්තු මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

495 – B 080969 —352 (2015/07)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 333

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද
නිලයේ ස්ථිර කිරීම්

*2014 නොවැම්බර් මස 28 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] යමන් සපුගේ වඥ සුජිත් කුමාර, එන්ආර්එක්ස් 1664, ශ්‍රීලංනාහ

*2014 දෙසැම්බර් මස 07 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] කපු ආරච්චිගේ තිවංක නිරෝෂාන් සමරවීර, එන්ආර්ඊ 2207, ශ්‍රීලංනාහ

*2015 පෙබරවාරි මස 01 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ)] රණසිංහගේ පුෂ්පිත රොෂාන්, එන්ආර්එස් 2236, ශ්‍රීලංනාහ

*2015 පෙබරවාරි මස 12 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] මල්දෙණියගේ පද්ම ශ්‍රී දේශප්‍රිය මල්දෙණිය, එන්ආර්එක්ස් 1797, ශ්‍රීලංනාහ

*2015 මාර්තු මස 12 වැනි දින සිට ලුතිනන් කොමාන්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] කහටපිටියගේ මංජුල ප්‍රියශාන්ත පෙරේරා, එන්ආර්එක්ස් 1802, ශ්‍රීලංනාහ

*2015 මාර්තු මස 26 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] තොටගමුවගේ ශශික ධනුෂ්ක ජයසේන, එන්ආර්එක්ස් 1782, ශ්‍රීලංනාහ

*2015 අප්‍රේල් මස 02 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] නයිදුවා වඩු ඩෙවෝන් කෝසල, එන්ආර්එක්ස් 1772, ශ්‍රීලංනාහ

*2015 අප්‍රේල් මස 23 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) (ඉ)] චන්දිම ඒකනායක, එන්ආර්ඊ 1751, ශ්‍රීලංනාහ

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) (ඉ)] විජේවර්ධන පටබැන්දලාගේ ප්‍රදීප් කුමාර විජේරත්න, එන්ආර්ඊ 1765, ශ්‍රීලංනාහ

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) (ඉ)] මුණගමගේ නොහොත් හෙට්ටිගේ බිහාර දිනේෂ්, එන්ආර්ඊ 1795, ශ්‍රීලංනාහ

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] බතල වත්තගේ මංජුල ප්‍රභාත් විමලරත්න, එන්ආර්ඊ 1796, ශ්‍රීලංනාහ

*2015 අප්‍රේල් මස 23 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :*

ලුතිනන් (වි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි)] මලවර කංකානමලාගේ කාවින්ද චරිත් ප්‍රේමරත්න, එන්ආර්එල් 1764, ශ්‍රීලංනාහ

ලුතිනන් (වි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි)] කංකානි ගෙදර ජනක ප්‍රසන්න රණතුංග, එන්ආර්එල් 1788, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජුනි මස 17 වැනි දින,
කොළඹ දී ය.

07 - 1308/3

---

2015 අංක 334

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව -ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද
උසස් කිරීමක්

*2015 ජනවාරි මස 15 වැනි දින සිට වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

වෛද්‍ය ලුතිනන් මඩවල කංකානම්ගේ අනුරුද්ධ උදේශික, එන්ආර්එම් 2407, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජුනි මස 17 වැනි දින,
කොළඹ දී ය.
07-1308/1

2015 අංක 335

MOD/DEF/03/02/PRO/RNF/01/06 (IV).

**ශ්‍රී ලංකා නාවික හමුදාව -ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2015 පෙබරවාරි මස 12 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) ඉමදූව වික්‍රම ආරච්චිගේ නුවන් ශ්‍රී මදුසංක, එන්ආර්ඊ 2318, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජුනි මස 17 වැනි දින,
කොළඹ දී ය.
07-1308/4

---

2015 අංක 336

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2015 මාර්තු මස 26 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් අන්සාර් මොහොමඩ් ෆයිසාල්, එන්ආර්එක්ස් 2343, ශ්‍රීලංනාහ

*2015 අප්‍රේල් මස 09 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) ඒකනායක මුදියන්සේලාගේ බුද්ධික ප්‍රසන්න ඒකනායක, එන්ආර්ඊ 2334, ශ්‍රීලංනාහ

*2015 අප්‍රේල් මස 30 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) සුබසිංහ ආරච්චිගේ නවීන් ප්‍රසාද් කරුණාරත්න, එන්ආර්ඊ 2328, ශ්‍රීලංනාහ

*2015 මැයි මස 02 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් වීරසේකරගේ ධනංජය දීපාල් රොද්‍රිගු, එන්ආර්එක්ස් 2250, ශ්‍රීලංනාහ

*2015 මැයි මස 02 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වියාබ) වශයෙන් :*

ලුතිනන් (වියාබ) දිසානායක ආරච්චිගේ ප්‍රියන්ත පුෂ්පකුමාර එන්ආර්ඉසෙඩ් 2276, ශ්‍රීලංනාහ

*2015 මැයි මස 07 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) කළුඅප්පු කංකානමලාගේ දොන් මලින් දිලංක කරුණාරත්න, එන්ආර්ඊ 2320, ශ්‍රීලංනාහ

ලුතිනන් (ඉ) සුහසිංහ පතිරණලාගේ යාපා දොන් ජගත් සුහසිංහ, එන්ආර්ඊ 2331, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජුනි මස 17 වැනි දින,
කොළඹ දී ය.
07-1308/2

---

2015 අංක 337

D/AF/31/2.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

2008 සැප්තැම්බර් මස 24 වැනි දින සිට පහත නම් සඳහන් කැඩෙට් නිලධාරීන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පයිලට් ඔපිසර්වරුන් වශයෙන් පත් කිරීමටත් එදිනම සිට ඔවුන්ගේ නම් වලට ඉදිරියෙන් ඇති ශාඛාවන්ට ඇතුළත් කිරීමටත් අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කොට ඇත.

11520 කැඩෙට් නිලධාරි විජේකෝන් මුදියන්සේලාගේ චානක හර්ෂ බණ්ඩාර, සැපයුම්
11521 කැඩෙට් නිලධාරි වීරකෝන් මුදියන්සේලාගේ මෝගීත් චතුරංග වීරකෝන්, නි.පො.රා
11522 කැඩෙට් නිලධාරි ප්‍රගීත් කැලුම් ගමගේ, සැපයුම්
11524 කැඩෙට් නිලධාරි නිමේශ් කසුන් අබේවර්ධන, කාර්/ඉංජී
11525 කැඩෙට් නිලධාරි බෙන්තොට සමිත් ගමගේ, කාර්/ඉංජී
11526 කැඩෙට් නිලධාරි කාරියවසම් මර්තිඥ්ඥ ගමගේ ලක්මාල් ජයසූරිය, කාර්/ඉංජී
11528 කැඩෙට් නිලධාරි කුකුලෙ වියන්නලාගේ නිරූදක තිලකරත්න, කාර්/ඉංජී
11529 කැඩෙට් නිලධාරි විතානගේ නුවන් ඉන්දීවර යාලගම, කාර්/ඉංජී

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

07-1561

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත් කිරීම් ආදිය

2015 අංක 338

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ චාන්දනී විජේවර්ධන මහත්මිය 2013 නොවැම්බර් මස 03 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්,

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

07-1369/1

---

2015 අංක 339

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ විශේෂ ශ්‍රේණියේ එම්. එස්. ඩී. රණසිරි මහතා 2014 ජූනි මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

07-1369/2

---

2015 අංක 340

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ අනුරාධ විජේකෝන් මහතා 2015 ජනවාරි මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ලේකම් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

07-1369/3

---

2015 අංක 341

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ ඩී. ඒ. එල්. නිමල් මහතා 2015 මාර්තු මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ වැඩබලන දිස්ත්‍රික් ලේකම්/දිසාපති වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

07 - 1369/4

---

2015 අංක 342

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ ආර්.එම්. පී. රත්නායක මහතා 2015 අප්‍රේල් මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

07-1369/5

## වෙනත් පත්කිරීම් ආදිය

2015 අංක 343

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අංශ අතර මාරුකිරීම

පහත නම සඳහන් නිලධාරියා 2015 ජුනි මස 30 වැනි දින සිට ජ්‍යෙෂ්ඨතාවයේ වෙනසක් නොමැතිව විධායක අංශයේ සිට විනයාරක්ෂක අංශය වෙත අංශ අතර මාරුකරන අතර, ඔහුගේ නව නිලය හා නිල අංකය පහත සඳහන් පරිදි වේ :-

වැඩබලන උප ලුතිනන් (විආ) නාරායන මුදියන්සේලාගේ සුරේෂ් අරවින්ද දිසානායක, එන්ආර්ආර් 3243, ශ්‍රීලංනාහ

එස්ජ්එම්ජේ පෙරේරා, ආර්ඩබ්පී, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

2015 ජූලි මස 08 වැනි දින,
කොළඹ දී ය.

07-1481

---

## රජයේ නිවේදන

**වන්දනා ගමන් ආඥාපනත**

විල්බාව ශ්‍රී පත්තිනි දේවාලයේ වාර්ෂික පෙරහැර මංගල්‍යය - 2015

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විල්බාව ශ්‍රී පත්තිනි දේවාලයේ වාර්ෂික පෙරහැර මංගල්‍යය - 2015 සැප්තැම්බර් මස 02 වැනි දින පැවැත්වෙන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකෙරෙන රෙගුලාසිවල දෙවැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඊ. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

2015 ජූලි මස 10 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-1269

---

**මඩ/මණ්ඩූර් ශ්‍රී කන්දස්වාමි දේවාලයේ වාර්ෂික උත්සවය - 2015**

මඩ/මණ්ඩූර් ශ්‍රී කන්ද්ස්වාමි දේවාලයේ වාර්ෂික උත්සවය 2015.08.09 වැනි දින ප.ව. 8.00 ට කොඩිය එසවීමෙන් ආරම්භ වී ඉන් පසු 2015.08.29 වැනි දින පෙ.ව. 10.00 ට දිය කැපීමේ උත්සවය පැවැත්වේ. පසුව එදින 9.00 ට කොඩිය පහත හෙළීමෙන් උත්සවය අවසන් වේ.

1949.05.27 වැනි දින හා අංක 5886 දරන *රජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මෙම කාල පරිච්ඡේදයේ ක්‍රියාත්මක වන බව මහජනතාවට දැනුම් දෙමි.

ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පෝරතිවු පත්තු.

07-1283

---

**තැපැල් හා විදුලි පණිවුඩ සුභ සාධක සංගමය**

(286 වැනි අංකාරය වූ) තැපැල් හා විදුලි පණිවුඩ සුභ සාධක සංගම් ආඥාපනතේ 11 වැනි වගන්තිය යටතේ තැපැල් හා විදුලි පණිවිඩ සුභ සාධක සංගමය විසින් සම්පාදිත හා එම වගන්තිය මගින් තැපැල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඔහු විසින් ස්ථිර කරන ලද රීතිය.

අබ්දුල් මජීඩ්,
ලේකම්,
මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යාංශය.

2015 ජුනි 29 වැනි දින,
තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල,
අංක 310 ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

රීති

1949 ජනවාරි මස 07 වැනි දින අංක 9936 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරනු ලැබූ තැපැල් හා විදුලි පණිවුඩ සුභ සාධක සංගමයේ රීති පහත දක්වෙන පරිදි තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

I වන පරිච්ඡේදය - සාමාන්‍ය රීති

II (i) ආ රීතිය පහත පරිදි සංශෝධනය කරන්න.

සාමාජිකයෙකුගේ මරණයක් සිදු වූ විට සංස්ථාවේ අරමුදලින් රුපියල් විසිපන්දහසක (රු.25,000) ක අවමංගල්‍යය ප්‍රදානයක් ගෙවිය යුතුය. මිය ගිය සාමාජිකයාගෙන් සංස්ථාවට අය විය යුතු යම් මුදලක් වේනම් එය මෙම ප්‍රදානයෙන් අඩුකර ගෙන ඉතිරිය ගෙවිය යුතු ය.

VI වන පරිච්ඡේදය - සාමාජිකයාගේ යැපෙන්නන් සඳහා මරණාධාර යෝජනා ක්‍රමය :

අංක (V) යටතේ පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කරන්න.

(V) සංස්ථාවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට ද අදාළ සාමාජික ගාස්තු ගෙවීමෙන් අංක 11 රීතියද ඇතුළත්ව මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලබා ගත හැකිය.

VII. වන පරිච්ඡේදය - විශේෂ භාණ්ඩ මිල දී ගැනීම සඳහා ණය

1 හා 3 රීති පහත පරිදි සංශෝධනය කරන්න.

(1) රීතියේ රුපියල් පනස් දහස (රු.50,000) යන්න ඉවත් කර රුපියල් ලක්ෂයක් (රු.1,00,000) ආදේශ කරන්න.

(3) රීතියේ රු. 50,000 ඉවත් කර, රු. 100,000 ආදේශ කරන්න.

VIII වන පරිච්ඡේදය - උත්සව අත්තිකාරම් ණය

1, 2 රීති පහත පරිදි සංශෝධනය කරන්න.

(1) රීතියේ රු. 10,000 යන්න ඉවත් කර රුපියල් පනස් දහස (රු.50,000) ආදේශ කරන්න.

(2) රීතිය උත්සව අත්තිකාරම් ණය මුදල සමාන වාරික 10 කින් ආපසු අය කර ගත යුතු ය. මාසික වාරිකයට අමතරව මාසික වාරිකයෙන් 10% මුදලක් සේවා ගාස්තුව ලෙස අය කර ගත යුතු. ලෙස සංශෝධනය කරන්න.

XI වන පරිච්ඡේදය - සුභ සාධක අරමුදල

3 ආ රීතිය ඉවත් කර ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කරන්න.

3.ආ. එම ශිෂ්‍යයින් 10 දෙනාම එම වසරේ අ.පො.ස. උ. පෙළ විභාගයෙන් උපරිම Z ස්කෝර් අගය මත අනුපිළිවෙලට තෝරා ගත යුතුය.

3.ඇ. රීතිය ඉවත් කර, 3 ඈ රීතිය 3 ඇ. රීතිය ලෙස නැවත නම් කරන්න.

07-1310

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/27/2015/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.07.31 වැනි දින සිට 2015.08.14 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.08.21 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

*උපලේඛනය*

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් දරන කොට්ඨාසයේ | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ, රාවතාවත්ත පිහිටි 'මීටියවත්ත' නැමැති ඉඩමේ නැගෙනහිර කොටසට මායිම්, | 01. අංක 1690/මුදල් දරන නඩු තීන්දුව මත අංක 2645 දරන උකස්කරය අවලංගු කිරීම. |

| *ලියාපදිංචි පොත්වල කැඩිබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *2013 ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර 2012* |
|---|---|---|
| 1325 වෙළුමේ 73 පත් ඉරුව. | *උතුර* : කිතලන්දළුව තොටුපලට යන කරත්ත පාර,<br>*නැගෙනහිර* : ජුවන් සිල්වාට අයත්ව තිබී දැනට හැරී සොයිසාට අයත් ඉඩම,<br>*දකුණ* : කලින් ජුවන් සිල්වාට අයිති ඉඩම හා කේ. ඇලිස් පෙරේරාට අයිති මෙම ඉඩමේම කොටසක්,<br>*බටහිර* : එම්. ජුවන් ප්‍රනාන්දුගේ ඉඩම සහ කේ. ඇලිස් පෙරේරාට අයිති මෙම ඉඩමේම කොටසක්.<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 23 3/4 | |

07 - 1498

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම

## සෙලාන් බැංකුව පීඑල්සී - කත්තන්කුඩි ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.05.26 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0740-07950010-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් වි. විනෝබා ඉන්දන් විසින් දෙකම සහතික කරන ලද 2013 සැප්තැම්බර් මස 03 දිනැති අංක 17449 සහ 2013 සැප්තැම්බර් මස 04 දිනැති අංක 17452 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කත්තන්කුඩි 01 පදිංචි මොහමඩ් මුස්තාපා මොහමඩ් ඊබ්‍රහිම් සහ සහිරා උම්මා ඊබ්‍රහිම් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හයකෝටි අනූනවලක්ෂ හැත්තෑනවදහස් හත්සිය විසි හයයි ශත හතරක (රු. 69,979,726.04) මුදලක්, 2015 පෙබරවාරි මස 02 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 69,979,726.04 මුදලද, 2015 පෙබරවාරි මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට පිළිවෙළින් සියයට පහළොව (15%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 17449 සහ 17452 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි සහ 2 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවන උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කත්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කත්තන්කුඩි හි වරිපනම් අංක 89 දරන වෝඩ් අංක 11 තුළ කත්තන්කුඩි නගර සභා සීමාව තුළ නව කත්තන්කුඩි ෆරූට්හවුස් නාගාර් තුළ ඒතුකාල් ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසය තුළ ඒතුකාල් ගමේ පිහිටි පිළිවෙලින් කාණ්ඩය/පත් ඉරුව බී 414, පත්ඉරු 89, 90, 92හි ලියාපදිංචි ටී.ජී 118672 හි ඒතුකාල් නැමැති ලොට් අංක 10666 සහ කාණ්ඩය බී 442 පත්ඉරුව 196 හි ලියාපදිංචි මුරුක්කාඩි මුනෙයි වලවු නමැති ඉඩමේ තවත් කොටසක් ලියාපදිංචි කරන ලද ඉඩම් තුනකින් සමන්විත බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරේ සිට දකුණට : නැගෙනහිර පැත්තෙන් අඩි 330ක්ද, නැගෙනහිර සිට බස්නාහිරට : බස්නාහිර පැත්තෙන් අඩි 430ක්ද, උතුරට : අඩි 340ක්ද, දකුණට : අඩි 260ක් මෙහි නැගෙනහිර කෙළවර සිට උතුරට : අඩි 100ක් මෙහි සිට නැගෙනහිරට : අඩි 80ක් සහ දැන් මෙය නැවත බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු ඒ. ඒ. කේ. තිස්ස වීරසිංහ විසින් 2013.07.26 දින මනින ලද අංක 648/2013 දරන මිණුම් සැලැස්මේ විස්තර කර ඇති ප්‍රකාර අක්කර දෙකයි, රූඩ් තුනයි, පර්චස් විසි පහයි දශම හතරයි දෙකක් (අ. 2, රූ. 3, පර්. 25.42) නොහොත් හෙක්ටයාර් 1,772ක් විශාල ඉඩමට මායිම්, නැගෙනහිරට : මුහුදු වෙරළ පාර සහ මුස්ලිම් පල්ලියට හිමි පරිශ්‍රය ද, බස්නාහිරට : දැන් කාසීම් සහ තවත්අය විසින් හිමිකම් කියනු ලබන නිවාස යෝජනා ක්‍රමයට හිමි ඉඩම උතුරට : දැන් අස්මි හිමිකම් කියනු ලබන කඩාපි ට හිමි ඉඩම සහ දකුණට : ධීවර දෙපාර්තමේන්තු පාර යන මායිම් තුළ පිහිටි සියලු දේ සමග ඉඩම.

### දෙවන උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කත්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වරිපනම් අංක237, 237 1/1, 237 1/2 දරන වෝඩ් අංක 2 තුළ කත්තන්කුඩි නගර සභා සීමාව තුළ නව මඩකලපුව පාරෙහි කොට්ඨාස - 2 ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයේ කත්තන්කුඩි

කොට්ඨාස අංක 2 තුළ කත්තන්කුඩි ගමේ පිහිටි පිළිවෙලින් කාණ්ඩය/පත් ඉරුව බී 472, පත්ඉරු 165 සහ බී 480, පත්ඉරු 89 සහ දකුණු කොටස කාණ්ඩය බී 552 පත්ඉරුව 204 ලියාපදිංචි කර ඇති ඉඩම් තුනකින් සමන්විත බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරේ සිට දකුණට නැගෙනහිර පැත්තෙන් බඹ 9ක් සහ බස්නාහිරට අඩි 1යි අඟල් 6ක්, බස්නාහිරට බඹ 8යි අඟල් 2ක්, නැගෙනහිර සිට බස්නාහිරට බඹ 12ක් සහ දන් මෙය නැවත බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු ඒ. එම්. නජුවුදීන් විසින් 2013.05.08 දින මැන අංක ඒඑම්එන්/13/කේටීටී 2885 දරන මිණුම් සැලැස්මේ විස්තර කර ඇති ප්‍රකාර පර්චස් නවයයි දශම දෙකයි නවයක් (අ. 0, රූ. 0, පර්. 9.29) නොහොත් හෙක්ටයාර් 0.0235ක් විශාල ඉඩමට මායිම්, නැගෙනහිරට : නව මඩකලපු පාර ද, බස්නාහිරට : පතුම්මාට හිමි ඉඩම ද, උතුරට : එම්. එම්. එච්. සුබයිර් හජ්ජියාර් ට හිමි ඉඩම සහ දකුණට : රහුමතුම්මාට හිමි ඉඩම යන මායිම් තුළ ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච්,
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති.

07-1263

---

පීවී 96436

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ ''රිවේරි හොටෙල් (පිවීටී) එල්ටීඩී'' හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ ''2014.01.08'' දින සංස්ථාපිත සමාගමක් වන ''රිවේරි හොටෙල් (පීවීටී) එල්ටීඩී'' ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ''රිවේරි හොටෙල් (පීවීටී) එල්ටීඩී'' නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2015 ජූලි මස 04 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-1272

පීවී 19760.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ ''ලීලා ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2004.06.21 දින සංස්ථාපිත සමාගමක් වන ''ලීලා ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' ව්‍යාපාරික කටයුතු වල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ''ලීලා ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2015 ජූලි මස 02 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07 - 1273

---

පී. බී. 4761.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "වි ඇන්ඩ් වී එක්ස්පෝට් එල්ටීඩී" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2011.07.08 දින සංස්ථාපිත සමාගමක් වන "වි ඇන්ඩ් වී එක්ස්පෝට් එල්ටීඩී" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "වි ඇන්ඩ් වී එක්ස්පෝට් එල්ටීඩී" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2015 ජූලි මස 04 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07 - 1274

පීවී 97784.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ ''ලැවිනියා කලෙක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2014.03.26 දින සංස්ථාපිත සමාගමක් වන ''ලැවිනියා කලෙක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ''ලැවිනියා කලෙක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2015 ජූලි මස 04 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-1275

---

පීවී 71918.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ ''සිනර්ජි එක්ස් බී පී ඕ සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම.

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ ''2010.04.16'' දින සංස්ථාපිත සමාගමක් වන ''සිනර්ජි එක්ස් බී පී ඕ සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ''සිනර්ජි එක්ස් බී පී ඕ සොලූෂන්ස් (ප්‍රයිවට්)ලිමිටඩ්'' නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3)වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2015 ජූලි මස 04 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-1276

---

පීවී 13860.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ ''කලා ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2003.04.24 දින සංස්ථාපිත සමාගමක් වන ''කලා ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' ව්‍යාපාරික කටයුතු වල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ''කලා ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2015 ජූලි මස 04 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-1277

---

පීවී 19653.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ ''මර්ක්ස් ට්‍රැවල්ස් ඇන්ඩ් ලෙෂර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 1997.07.25 දින සංස්ථාපිත සමාගමක් වන ''මර්ක්ස් ට්‍රැවල්ස් ඇන්ඩ් ලෙෂර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත් අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ''මර්ක්ස් ට්‍රැවල්ස් ඇන්ඩ් ලෙෂර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2015 ජූනි මස 30 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-1278

පීවී 69001

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "රයිනෝ එක්ස්පෝට්ස් (පීවීටී) එල්ටීඩී'' හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2009.08.31'' දින සංස්ථාපිත සමාගමක් වන "රයිනෝ එක්ස්පෝට්ස්(පීවීටී) එල්ටීඩී'' ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත් අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "රයිනෝ එක්ස්පෝට්ස් (පීවීටී) එල්ටීඩී'' නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2015 ජුලි මස 04 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-1279

---

පීවී 62968.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "විහන්ගී මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ ''2008.02.07'' දින සංස්ථාපිත සමාගමක් වන "විහන්ගී මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, විහන්ගී මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2015 ජුනි මස 30 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-1280

පීවී 77736

**2007 අංක 07 දරන සමාගම් පනත**

**394 (3) වගන්තිය යටතේ "ඩැකා සෙකියුරිටි සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම.**

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ '"2011.03.14'' දින සංස්ථාපිත සමාගමක් වන "ඩැකා සෙකියුරිටි සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ඩැකා සෙකියුරිටි සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2015 ජුනි මස 30 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-1281

---

**ඩීඑෆ්සීසී වර්ධන බැංක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැංක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැංක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දක්වෙන යෝජනා සම්මතය 2015 ජනවාරි මස 15 දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී වර්ධන බැංක් පීඑල්සී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඉඳුනි කරුණානන්ද විසින් ලියා සහතික කරන ලද අංක 153 හා 154 සහ 2006 ජනවාරි මස 27 දින දරන උකස් බැඳුම්කර දෙක මත, අයවිය යුතු මුදල් ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද ලියාපදිංචි අංක PV 14584 දරන්නා වූ සහ ලියාපදිංචි කාර්යාලය වාරියපොළ පිහිටා ඇත්තා වූ ද, (මේ - න් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරන) "නෝත් වෙස්ටර්න් ඇපරල් (ප්‍රයිවේට්) ලිමිටඩ්'' සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 නොවැම්බර් 30 වැනි දින ඉහත කී නෝත් වෙස්ටර්න් ඇපරල් (ප්‍රයිවෙට්) ලිමිටඞ් සමාගමෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් පණස්නව ලක්ෂ හතළිස් හත් දහස් හත්සිය දහහතකුත් ශත හැත්තෑ දෙකක (රු.59,47,717.72) මුදලක් සහ 2014 දෙසැම්බර් 01 දින පටන් විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට පහළොව (15%) බැගින් පොළිය ද, එක්සත් ජනපද ඩොලර් හතළිස් හත් දහස් පන්සිය හැටහයකුත් ශත පණස් පහක (එ. ජ. ඩො. 47,566.55) මුදලක් සහ 2014 දෙසැම්බර් 01 දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් එක්සත් ජනපද ඩොලර් විසිඅට දහස් පණස් නවයකුත් ශත විසිහතරක් (එ. ජ. ඩො. 28,059. 24) සඳහා වර්ෂයකට සියයට නවය (9%) බැගින් පොලිය සහ එක්සත් ජනපද ඩොලර් දෙදහස් අටසියයක් (එ. ජ. ඩො. 2800) සඳහා වර්ෂයකට සියයට පහකුත් දශම නවයයි නවයක් (5.99%) බැගින් පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද ;

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් පණස් නව ලක්ෂ හතළිස් හත් දහස් හත්සිය දහහතකුත් ශත හැත්තෑ දෙකක (රු.59,47,717.72) මුදලක් සහ 2014 දෙසැම්බර් 01 දින පටන් විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට පහළොව (15%) බැගින් පොලිය ද, එක්සත් ජනපද ඩොලර් හතළිස් හත් දහස් පන්සිය හැටහයකුත් ශත පණස් පහක (එ. ජ. ඩො. 47,566.55) මුදලක් සහ 2014 දෙසැම්බර් 01 දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් එක්සත් ජනපද ඩොලර් විසිඅට දහස් පණස් නවයකුත් ශත විසිහතරක් (එ. ජ. ඩො. 28,059.24) සඳහා වර්ෂයකට සියයට නවය (9%) බැගින් පොළිය සහ එක්සත් ජනපද ඩොලර් දෙදහස් අටසියයක් (එ. ජ. ඩො. 2800) සඳහා වර්ෂයකට සියයට පහකුත් දශම නවයයි නවයක් (5.99%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ පහත විස්තර කරන යන්ත්‍රෝපකරණ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර, එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අය කර ගැනීම සඳහා ඉහත කී අංක 153 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර තිබෙන මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ ඉහත කී අංක 154 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර තිබෙන මෙහි පහත විස්තර කරන යන්ත්‍රෝපකරණ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 153 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැද්ද කෝරළේ, දේවමැදි හත්පත්තුවේ, විලාකටුපොත පිහිටි අඹගහමුලවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක ආරියදාස අතපත්තු මැන සකස් කළ අංක 90/91 හා 1991.10.20 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 10C 1 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, *උතුරු - නැගෙනහිරට* : ලොට් අංක 10A සහ 10B දරන අඩි 15 ක් පළල පාර සඳහා වෙන් කළ බිම ද *දකුණු නැගෙනහිරට* : (අඩි 15 ක් පළල පාරක් සඳහා වෙන් කළ) ලොට් 10B ද *දකුණු-බස්නාහිරට* : ලොට් 10C 2 ද උතුරු-බස්නාහිරට : ලොට් අංක 11 ද යන මායිම් ඇතුළත අංක 90/91 දරන පිඹුර ප්‍රකාර පර්චස් දෙකකුත් දශම බිංදුවයි හතක් (අ. 0, රූ. 0, පර්. 2.07) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

එම ලොට් 10C1 ලකුණු කළ බිම් කට්ටිය මෙහි පහත සවිස්තරව විස්තර කරන බිම් කට්ටියෙන් බෙදා වෙන් කළ කොටසක් වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැද්ද, කෝරළේ, දේවමැදි හත්පත්තුවේ, විලාකටුපොත පිහිටි අඹගහමුලවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක ආරියදාස අතපත්තු මැන සකස් කළ අංක 90/91 හා 1991.10.20 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 10C සහ 10D ලෙස ලකුණු කළ බෙද වෙන් කළ බිම් කට්ටියට මායිම්, *උතුරට* : ලොට් අංක 10A සහ 10B ද, *නැගෙනහිරට* : කලින් ග්‍රෙස්නෝනා ට අයිතිව තිබුණු දැනට හේමචන්ද්‍රගේ ඉඩම ද, *දකුණට* : කලින් ග්‍රෙස්නෝනා ට අයිතිව තිබුණු දැනට හේමචන්ද්‍රගේ ඉඩම සහ ජයන්ත මල්වතුගොඩගේ ඉඩම ද *බස්නාහිරට* : ලොට් අංක 11 ද යන මායිම් ඇතුළත අංක 90/91 දරන පිඹුර ප්‍රකාර රූඩ් තුනක් (අ. 0, රූ. 3, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැද්ද කෝරළේ, දේවමැදි හත්පත්තුවේ, විලාකටුපොත පිහිටි අඹගහමුලවත්ත නැමති ඉඩමේ, බලයලත් මානක ආරියදාස අතපත්තු මැන සකස් කළ අංක 90/91 හා 1991.10.20 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 10C2 ලෙස ලකුණු කළ බෙද වෙන් කළ බිම් කට්ටියට මායිම්, *උතුරු - නැගෙනහිරට* : (අඩි 15 ක් පළල පාරක් සඳහා වෙන්කළ) ලොට් අංක 10C1 සහ 10B ද, *දකුණු-නැගෙනහිරට* : ග්‍රෙස්නෝනා ට කළින් අයිතිව තිබුණු දැනට හේමචන්ද්‍රගේ ඉඩම ද *දකුණු-බස්නාහිරට* : ලොට් 10D ද *උතුර බස්නාහිරට* : ලොට් අංක 11 ද යන මායිම් ඇතුළත අංක 90/91 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකකුත් පර්චස් විස්සයි දශම නවයයි තුනක් (අ. 0, රූ. 1, පර්.20.93) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

3. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැද්ද කෝරළේ, දේවමැදි හත්පත්තුවේ, විලාකටුපොත පිහිටි අඹගහමුලවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක ආරියදාස අතපත්තු මැන සකස් කළ අංක 90/91 හා 1991.10.20 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 10D ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, *උතුරු - නැගෙනහිරට* : ලොට් අංක 10C 2 ද, *දකුණු-නැගෙනහිරට* : ග්‍රෙස්නෝනා ට කළින් අයිතිව තිබුණු දැනට හේමචන්ද්‍රගේ ඉඩම ද, දකුණු බස්නාහිරට ජයන්ත මල්වතුගොඩ හිමිකම් කියන ඉඩම ද, *උතුරු - බස්නාහිරට* : ලොට් අංක 11 ද යන මායිම් ඇතුළත අංක 90/91 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකකුත් පර්චස් දහහතක් (අ. 0, රූ.1, පර්. 17) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

මෙයට එකී අංක 90/91 දරන පිඹුරේ ලොට් අංක 10B ලෙස ලකුණු කළ (අඩි 15 ක් පළල) පාරක් සඳහා වෙන් කළ බිම් කට්ටිය මතින් සහ ඔස්සේ මාර්ග අයිතියද හිමිය.

අංක 154 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

අවුලේගම, අතව පරිශ්‍රයේ තුළ සහ මත දැනට තිබෙන -

| *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|
| අනුක්‍රමික අංකය 1403 | 01 |

මෝස්තර අංකය F912-9 කලර් 12 ක් හෙඩ් කලර් මොනිටර් එම්බ්‍රොයිඩරි මැසිම සහ

අමතර කොටස්, උපාංග සහ මෙවලම් ද ඇතුළුව අවුලේගම, අතව පිහිටි පරිශ්‍රය තුළ සහ මත සහ එකී සමාගම විසින් දැනට සහ මින් ඉදිරියට කවර හෝ අවස්ථාවක ව්‍යාපාර කරගෙන යන සහ කලින් කළ ව්‍යාපාර

කරගෙන යනු ලැබිය හැකි වෙනත් යම් ගුදම්, ගබඩා සහ පරිශ්‍රයක් තුළ හෝ මත සහ එම චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ කලින් කල ගබඩා කරනු ලබන, දමා තබනු ලබන හෝ තැන්පත් කරනු ලබන යම් පරිශ්‍රවල තිබෙන චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ද සහ එකී චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග සහ මෙවලම් වෙනුවට ප්‍රතියෝජනය කරනු ලැබීම සඳහා ඉහත කී පරිශ්‍රවලට වරින් වර හා සෑම කල්හිම ගෙන එනු ලබන, ඒවායේ තැන්පත් කරනු ලබන හෝ දමනු ලබන එකී ගුදම්, ගබඩා සහ පරිශ්‍රවල තිබෙන සමාගමේ සියළු චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ අමතර කොටස්, උපාංග හා මෙවලම් හෝ සමාගම විසින් එහි ව්‍යාපාර හෝ කර්මාන්තය යම් වේලාවක සහ කලින් කල ඉවත් කරගෙන යනු ලබන වෙනත් කවර හෝ ස්ථානයක හෝ ගුදම්, ගබඩා සහ පරිශ්‍රවල තබා තිබෙන සමාගමේ එකී සියලු චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ අමතර කොටස්. උපාංග සහ මෙවලම්.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරි,

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

07-1324

---

### ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2015 පෙබරවාරි 27 වන දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. සිල්වා, ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ගනේගොඩ විසින් පිළිවෙළින් ලියා සහතික කරන ලද අංක 796/2020/1236 හා 2009 දෙසැම්බර් 27 දින ද 2010 ජනවාරි 06 දින ද 2010 ජනවාරි 08 දින ද දරන උකස් බැඳුම්කරය මත ද, ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. සිල්වා, ප්‍රසිද්ධ නොතාරිස් එස්. වලතර සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් පිළිවෙළින් ලියා සහතික කරන ලද අංක 943/1701/2087 හා 2010 ජූනි 09, 2010 ජූලි 07 සහ 2010 ජූලි 12 දින දරන උකස් බැඳුම්කර මත ද ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. සිල්වා, ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ඩබ්ලිව්. මීගහවෙල සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. බස්නායක විසින් පිළිවෙළින් ලියා සහතික කරන ලද අංක 1351/129/113 හා 2011 සැප්තැම්බර් 22, 2011 නොවැම්බර් 15 සහ 2011 නොවැම්බර් 18 දින ද දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, ඉහළ බියන්විල පදිංචි, යද්දෙහිගේ ටෙන්සන් ද සිල්වා සහ නිමාලි අමරනායක ධනපාල යන දෙදෙනා විසින් පැහැර හැර ඇති හෙයින් ද :

2014 ඔක්තෝබර් 31 දිනට ඉහත කී අංක 796/2020/1236, අංක 943/1701/2087 සහ අංක 1351/129/113 දරන උකස් බැඳුම්කර මත එකී යද්දෙහිගේ ටෙන්සන් ද සිල්වා සහ නිමාලි අමරනායක ධනපාල යන අයගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් එක්කෝටි හය ලක්ෂ අසූතුන්දහස් දෙසිය හතලිස් දෙකකුත් ශත හැත්තෑ එකක (රු.1,06,83,242.71) මුදලක් සහ 2014 නොවැම්බර් 01 දින පටන් විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට විසිහතරක (24%) අනුපාතිකය මත වැඩිදුර පොළිය ද රුපියල් විසිනව ලක්ෂ දහනව දහස් හයසිය අනූඅටකුත් ශත පනස් නවයක (රු.29,19,698.59) මුදලක් සහ 2014 නොවැම්බර් 01 දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිතුන් ලක්ෂ හත් දහස් තුන්සිය දහතුනකුත් ශත අසූ දෙකක් (රු.23,07,313.82) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට නවයයි දශම හතයි තුනක් (9.73%) ඉහළ අනුපාතිකය මත ගණනය කරන වැඩිදුර පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද :

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එක්කෝටි හය ලක්ෂ අසූතුන්දහස් දෙසිය හතළිස් දෙකකුත් ශත හැත්තෑ එකක (රු. 1,06,83,242.71) මුදලක් සහ 2014 නොවැම්බර් 01 දින පටන් විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට විසිහතරක (24%) අනුපාතිකය මත වැඩිදුර පොළිය ද, රුපියල් විසිනව ලක්ෂ දහනව දහස් හයසිය අනූඅටකුත් ශත පනස් නවයක (රු.29,19,698.59) මුදලක් සහ 2014 නොවැම්බර් 01 දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිතුන් ලක්ෂ හත් දහස් තුන්සිය දහතුනකුත් ශත අසූ දෙකක් (රු.23,07,313.82) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට නවයයි දශම හතයි තුනක් (9.73%) ඉහළ අනුපාතිකය මත ගණනය කරන වැඩිදුර පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී අංක 796/2020/1236 ද අංක 943/1701/2087 ද අංක 1351/129/113 ද දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 796/2020/1236 ද අංක 943/1701/2087 ද අංක 1351/129/113 දරන උකස් බැඳුම්කර මගින් ඉහත කී යද්දෙහිගේ ටෙන්සන් ද සිල්වා විසින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර තිබෙන මෙහි පහත විස්තර කරන ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 796/2020/1236 ද අංක 943/1701/2087 ද අංක 1351/129/113 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කෝරළේ, දිඹුලමුරේ, පිහිටි, ''දිඹුලමුරේකනත්ත'' නමැති ඉඩමේ බලයලත් මානක එච්. ඩබ්ලිව්. මුණසිංහ මැන සකස් කළ අංක 2152 හා 1987.10.21 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 18 සහ 19 ලකුණු කළ එකට යාවූ බෙද වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුර : අංක 2152 දරන පිඹුරේ ලොට් අංක 17 සහ 20 ද නැගෙනහිරට : ලොට් අංක 45 සහ 46 (අඩි 20 ක් පළල පාර) ද, දකුණට : ලොට් අංක 45 සහ 46 දකුණට ලොට් අංක 4 ද බස්නාහිරට :

ගම්සභා පාර ද යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් දහයක් (අ. 0, රූ. 1, පර්. 10) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 79/102 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර තිබේ.

මෙම ඉඩම් මෑතකදී කරන ලද මැනීමකට අනුව පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කෝරළේ, දිඹුලමුරේ පිහිටි, "දිඹුලමුරේකනත්ත'' නමැති ඉඩමේ බලයලත් මානක එල්. කේ. ගුණසේකර මැන සකස් කළ අංක 5014 හා 2005.05.29 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙද වෙන් කළ එකට යාවු බිම් කට්ටියට මායිම්, *උතුරට* : බලයලත් මානක එච්. එම්. මුණසිංහ මැන සකස් කළ අංක 2152 පිඹුරේ ලොට් අංක 17 සහ 20 ද, *නැගෙනහිරට* : පාර ද, *දකුණට* : පාර ද *බස්නාහිරට* : පාරද යන මායිම් ඇතුළත ඉහත කී අංක 5014 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකකුත් පර්චස් දහයක් (අ. 0, රූ. 1, පර්. 10) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි දෙකයි හයයි පහක් (හෙ.0.1265) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

ලක්ෂ්මන් සිල්වා,<br>
ප්‍රධාන විධායක නිලධාරි,

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී,<br>
අංක 73,<br>
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,<br>
කොළඹ 02.

07-1325

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2015.06.10 වැනි දින පවත්වන ලද රැස්වීමේදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. ඩබ්. තිලකරත්න විසින් සහතික කරන ලද 2011 දෙසැම්බර් මස 27 දිනැති අංක 2066 දරන උකස් බැඳුම්කරයට අනුව 1 වන ණය මුදල මත 2015.03.25 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් එක්කෝටි හැත්තෑ හත් ලක්ෂ දහදහස් දෙසිය පනස් හතයි ශත හැට නවයක (රු. 1,77,10.257.69) මුදල සමග රුපියල් එක්කෝටි පනස් හතර ලක්ෂ ,නවදාහක (රු. 1,54,09,000.00) මුදලක් මත වසරකට සියයට එකොළහයි දශම දෙකයි පහ (11.25%) බැගින් 2015.03.26 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පොළිය ද, 2 වන ණය මත 2015.03.25 දිනතෙක් මුදල් මුදල හා පොළිය වශයෙන් රුපියල් හතලිස් හතර ලක්ෂ විසිඑක්දහස් තුන්සිය පනහයි ශත විස්සක (රු. 44,21,350.20) මුදල සමග රුපියල් තිස්හය ලක්ෂ හැත්තෑපන්දාහක (රු. 36,75,000.00) ක මුදලක් මත වසරකට සියයට දහතුන (13%) බැගින් 2015.03.26 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් වත්තල, පරණ මීගමුව පාරේ, ශාන්ත ඇන්තනීස් මාවතේ, අංක 118/36හි උරුතිර ඒජන්සි වෙතින් (කොළඹ 04 ඇල්ෆෙන්ඩලි පටුමග, අංක 3හි රාජලිංගම් චන්ද්‍රසේගරම් මයා සහ ලෝගේෂ්වරී චන්ද්‍රසේගරම් මිය හවුල්කරුවෝ වෙති) අයවිය යුතුව ඇත.

2. 2011.12.27 දිනැති එකී අංක 2066 දරන උකස් බැඳුම්කරය මත පළමු ණය මුදල මත අයවිය යුතු රු. එක්කෝටි හැත්තෑ හත් ලක්ෂ දහදහස් දෙසිය පනස් හතයි ශත හැට නවයක (රු. 1,77,10,257.69) මුදල සහ දෙවන ණය මුදල මත අයවිය යුතු හතලිස් හතර ලක්ෂ විසිඑක් දහස් තුන්සිය පනහයි ශත විස්සක (රු. 44,21,350.20) සමග 2015.03.26 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ අංක 50/3 හි පදිංචි ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුවේ, වැල්ලවත්ත ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුහට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල මාබෝල නගර සභා සීමාව තුළ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 179 දරන වත්තල ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, කුඩා ඒදණ්ඩෙහි මීගමු පාරේ පිහිටි "කහටගහවත්ත මිල්ලගහවත්ත දෙල්ගහවත්ත සහ කහටගහඹිවිට" නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු වී. සිවසුන්දරම් විසින් සාදන ලද 1977 සැප්තැම්බර් 20 දිනැති අංක 1043F දරන පිඹුරෙහි ලොට් 1[5] ලෙස දක්වා සීමා නීර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1[5] උතුරට : බලයලත් මිනින්දෝරු වී. සිවසුන්දරම් විසින් සාදන ලද 1971 පෙබරවාරි 10 වැනි දිනැති අංක 1043 දරන පිඹුරෙහි ලොට් A (පාරට වෙන් කළ කොටස) ද, නැගෙනහිරට : එකී අංක 1043 දරන පිඹුරෙහි ලොට් H ද, දකුණට : වරිපනම් අංක 38/2 සහ 42 (KER) දරන පරිශ්‍රයන් ද බස්නාහිරට : ලොට් 13 සහ 14 ද, මායිම්ව එකී අංක 1043F දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් දහයයි දශම බිංදුවයි නවයක (අ. 00, රූ. 1 පර්. 10.09) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B776/113 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ජී. චන්ද්‍රසේන විසින් මෑතකදී සාදන ලද 1994 අගෝස්තු 27 දිනැති අංක 167/94 දරන පිඹුරට අනුව එකී ඉඩම පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී මීගමු පාරේ පිහිටි "කහටගහවත්ත මිල්ලගහවත්ත දෙල්ගහවත්ත සහ කහටගහඹිවිට" නැමති ඉඩමෙහි එකී අංක 167/94 දරන පිඹුරෙහි ලොට් A ලෙස දක්වා සීමා නීර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A උතුරට : සාන්ත අන්තෝනි පාරද, නැගෙනහිරට : සාන්ත අන්තෝනි පාරේ වරිපනම් අංක 118/35 දරන පරිශ්‍රය ද, දකුණට : කුඩා ඒදණ්ඩ පාරේ වරිපනම් අංක 38/23 සහ 42 දරන පරිශ්‍රයන් ද සහ බස්නාහිරට : සාන්ත අන්තෝනි පාරේ වරිපනම් අංක 115/43 A සහ 118/37 දරන පරිශ්‍රයන් ද මායිම්ව එකී අංක 167/94 දරන පිඹුර ප්‍රකාර පර්චස් හතලිස් නවයයි දශම තුනයි පහක (අ. 00, රූ. 0, පර්. 49.35) හෙවත් හෙක්ටයාර 0.1248ක බිම් ප්‍රමාණකින් යුක්ත වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජේ. ඥානසම්බන්දන්,<br>
ප්‍රධාන කළමනාකාරිණී.

ලංකා බැංකුව,<br>
වැල්ලවත්ත.

07 - 1510

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.